රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 01/98

මගේ අංකය : ආ/III/2/1-3
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
1998.01.23

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධමය වාතාවරණය හා යුද්ධ මෙහෙයුම් හේතුවෙන් අවතැන් වී සේවයට වාර්තා කිරීමට නොහැකිවන රාජ්‍ය නිලධාරීන්ට විශේෂ නිවාඩු.**

ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 12 වගන්තිය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවන අතර, එම වගන්තියට 12:14 වශයෙන් අළුතෙන් උප වගන්තියක් එකතු කිරීමෙන් ආයතන සංග්‍රහය සංශෝධනය කරනු ලැබේ.

12:14 අනුමත කරන ලද නිවාඩු පිට, තම සේවා ස්ථානයෙන් බැහැරව ගොස් සිටින කිසියම් නිලධාරියෙකුට, රජයේ ආරක්ෂක හමුදාවන් විසින් කරනු ලබන යුද්ධ මෙහෙයුම් නිසා එම නිවාඩුව අවසානයේ තම සේවා ස්ථානවලට සේවය සඳහා නියමිත දිනට වාර්තා කිරීමට නොහැකි වන අවස්ථාවලදී මෙම වගන්තිය යටතේ විශේෂ නිවාඩු ලබා දිය හැකිය. මෙම නිවාඩු අනුමත කිරීමට පෙර නිවාඩු අනුමත කරන නිලධාරියා විසින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් විමසා උක්ත ප්‍රදේශවල එම තත්ත්වය පිළිබඳ සත්‍යතාවය සහතික කරවා ගත යුතුය.

02. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 1996.01.01 දින සිට බලපැවැත්වේ.

(ඩික්සන් නිලවීර)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය